# “ෂරිආ” පිළිවෙත පිළිබඳ විමසුමක්

[ සිංහල – Sinhala – سنهالي ]

මුහම්මද් මන්සූර් දහ්ලාන්

2013 - 1434

IslamHouse.com

# استفسار عن أحكام الشريعة

« باللغة السنهالية »

محمد منصور دحلان

2013 - 1434

IslamHouse.com

# “ෂරිආ” පිළිවෙත පිළිබඳ විමසුමක්.

ඉස්ලාමයට එරෙහිව විවිධ මාධ්‍යයන් මගින් මතු කොට ඇති විවේචන දෙස බලන විට එක් පොදුතාවක් ඉතා පැහැදිලිව ම දක්නට ඇත. එනම් විවේචන ඉදිරිපත් කරන්නන් විවේචනයට අදාළ විෂය පිළිබඳව පැහැදිලි හා ගැඹුරු දැනුමකින් තොරව තම සිතෙහි මතු වී ඇති ඉස්ලාම් පිළිකුල හා ඉස්ලාම් භීතිකාව පමණක් පදනම් කර ගෙන කෙන්ද කන්ද කර පෙන්වීමේ වෑයමක නිරත වී ඇති බවය. බොහෝ අවස්ථාවන්හි දී කෙන්දක් තරම්වත් හේතු නොමැතිව විවේචන ඉදිරිපත් කර තිබීම පිළිබඳව දැඩි කනස්සල්ලට හා සිත් වේදනාවට පත් වන්නෙමු. ඉස්ලාමිකයින් වන අපි අල් කුර්ආනයේ හා දෙවිඳුන් විසින් මනුෂ්‍ය වර්ගයාට යහමඟ පෙන්වීම උදෙසා පත් කළ අවසන් ධර්ම දූතයාණන් වූ මුහම්මද් තුමාණන්ගේ (එතුමා කෙරෙහි දෙවිඳුන්ගේ ආශිර්වාදය හා සාමය අත්වේවා) මඟ පෙන්වීම අනුගමනය කරන්නන් වශයෙන් කිසිම දහමකට අපහාස නොකරන්නට බැඳී සිටින්නෙමු. සමහර අවස්ථාවන්හි දී නිවැරදි මූලාශ්‍රයන් පදනම් කර ගෙන අර්ථදායක විවේචන ඉදිරිපත් කළත් පදනම් විරහිත අන්දමින් දහම් කෙරෙහි අපහාසාත්මක ලෙස කරුණු ඉදිරිපත් කිරීමක් මුස්ලිම් වරයෙකුගෙන් සිදු නොවිය යුතුම කරුණකි.

“*අල්ලාහ් හැර ඔවුන් අයැදින දැට (හෝ අයට) නුඹලා අපහාස නොකරවූ*” (අල් කුර්ආනය 4 : 108)

මෙම පැහැදිලි උපදේශය පිළිගෙන ඒ අනුව කටයුතු කිරීමට අපි බැඳී සිටින්නෙමු. එම නිසා නොදැනුවත් කමින් ඉස්ලාමයට එරෙහිව මතු කරන චෝදනා පිළිබඳව අපට අනුගමනය

කරන්නට විවෘතව ඇත්තේ සත්‍යය අසත්‍යය කුමක් ද යන්න පැහැදිලි කර දීම පමණි. ඒ අනුව ‘ෂරිආ’ පිළිබඳ ව මතු වී ඇති වැරදි අවබෝධයන් පැහැදිලි කර දීමේ උත්සාහයක යෙදෙන්නට මෙම ලිපිය මගින් කටයුතු කර ඇත්තෙමු.

## “ෂරිආ” යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

මෙහි පදගතාර්ථය නම් ‘දිය ඇලක් වෙත යොමු වී ඇති ජල මාර්ගයක්, දිය බොන ස්ථානයක්, මාවතක් හෝ නිවැරදිමඟ’ යන්නය. මෙම අර්ථයන් ගෙන් අපේක්ෂිත තැනකට හෝ නිශ්චිත ඉලක්කයක් කරා යොමු වූ මාවතක් හෝ මඟක් යන අර්ථය ගෙන දීමට ෂරිආ යන පදය යොදා ගනු ලැබිණ. අල් කුර්ආනයේ ෂරිආ යන පදය හා එහි විවිධ අනු ප්‍රභේධ පිළිබඳව ස්ථාන පහක සඳහන් වී ඇති නමුත් එහි විස්තීර්ණ භාවිතය පසු කාලීනව සිදු වුවකි. ඉස්ලාමයේ ආරම්භක කාල වකවානුවේ ‘ඉස්ලාම්’ ‘දීන්’ යන පදයන් මේ වෙනුවට උපයෝගී කර ගන්නා ලදී.

මුස්ලිම් වරුන්ගේ ජීවිත හසුරුවන නීති මාලාවන්, නියාමනයන්, ඉගැන්වීම්, හා අගයන් හුවා දැක්වීමට සංකල්පාත්මකව ෂරිආ යන පදය උපයෝගී කර ගනු ලැබේ. මෙය මුස්ලිම් වරයෙකුගේ පරිපූර්ණ ජීවන සැලැස්ම අඩංගු වූ ඉතා පළල් සංකල්පයකි. නැමදුම, සදාචාරය, පුද්ගල ආකල්ප හා කල් ක්‍රියාව මෙන්ම දේශපාලන, ආර්ථික, සමාජීය, සමාජ සත්කාර ක්ෂේත්‍රයන් ද අපරාධ හා සිවිල් අංශයන් ද තනි පුද්ගල අයිති වාසිකම් හා සමාජීය අයිතිවාසිකම් ද මෙයට අන්තර්ගත වෙයි.

එහෙයින් ෂරිආ යනු දෙවිඳුන් ව විශ්වාස කර පිළිගන්නා ජනයාට මෙලොව හා මතුලොව ජය අත් පත් කර ගැනීම

උදෙසා අනුගමනය කිරීමට දෙවිඳුන් විසින් සකස් කර දී ඇති මාවතක් ලෙස විග්‍රහ කිරීම වඩාත් සුදුසු වෙයි.

## <u>ෂරිආ හි අපේක්ෂිත අරමුණු කුමක්ද?</u>

ෂරිආ හි මූලික අරමුණ වන්නේ ප්‍රතිපත්තියක් වශයෙන්ම මිනිසුන් මුහුණපාන දුෂ්කරතාවන් ඉවත් කොට ඔවුන්ගේ ප්‍රශ්න හා ගැටලු වලට යහ විසඳුම් ලබා දීමය. පොදු වශයෙන් ෂරිආ පිළිවෙත මගින් පුද්ගලයින් හා සමාජයට දැහැමි වන්නට දිරි ගන්වන අතර දෙවිඳුන්ට සමීපතාවක් ගොඩ නගා ගන්නට මග පෙන්වයි. සමාජයන් ආරක්ෂිතව සහයෝගීතාවකින් යුක්තව ඒකීයත්වය පිළිබඳ හැඟීමකින් හා විශ්වාසයකින් මෙන්ම සැවොම එකිනෙකාට උපකාර කර ගනිමින් යහකම දිරිගන්වමින් හා දෙවිඳුන් හට අප්‍රිය වූ අයහකමින් එකිනෙකා වළකමින් කටයුතු කිරීම මිනිස් සමාජයේ යහ පැවැත්මට අත්‍යවශ්‍ය කරුණකි.

<u>**දහම**</u> සුරක්ෂිත කිරීම ෂරිආ හි අරමුණු අතරින් වැදගත් ස්ථානයක් ගනියි. මිනිස් ජීවිතයේ හරය හා සාරය ලෙස ගැනෙන්නේ දහමය. මිනිසාගේ මෙලොව හා මතුලොව ජය රැඳී ඇත්තේ දහමේ නිවැරදි මග පෙන්වීම් අනුගමනය කිරීම මතය.

<u>**ජීවිත ආරක්ෂණය**</u> ෂරිආ හි තවත් වැදගත් අරමුණක් වෙයි. කිසිදු ජීවියෙකුට හිරිහැර කිරීමට හෝ අන් අයගේ ජීවිත හානි කිරීමට හෝ අයිතියක් කිසිවෙකුට නොමැත. අන් අයගේ ජීවිත අනුල්ලංඝනීය බව ඉස්ලාමය උගන්වන අතර අහිංසක ජීවිත වලට හානි සිදු කිරීම මහා පාපයක් ලෙස ද සලකයි.

**<u>බුද්ධිය</u>** ආරක්ෂා කිරීමද ෂරිආ හි තවත් වැදගත් අරමුණක් වෙයි. මුස්ලිම් වරයෙකු සෑම විටම සන්සුන් හා තැන්පත් කමකින් යුක්ත විය යුතුය. මත් පැන් මත් කුඩු හා සියලුම මත් ද්‍රව්‍යයන්ගෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය වෙයි. බුද්ධිය හා මනස ව්‍යාකූලත්වයට පත් කරන්නා වූ මත්ද්‍රව්‍ය හා අනෙකුත් දෑ පුද්ගලයාට හා සමාජයට අති හානිකරය.

**<u>දේපළ හා ධනය</u>** ආරක්ෂා කිරීම ඉතා වැදගත් තැනක් ෂරිආ පිළිවෙතේ අන්තර්ගතය. පුද්ගල ආරක්ෂණය පිළිබඳ හැඟීම පරිපූර්ණ වීමට නම් තම ශ්‍රමයේ ඵලය ලෙස සැලකෙන දේපළ හා ධනය සුරක්ෂිත විය යුතුය. සොරකමින් හා බලහත්කාරකමින් තම වස්තුව රැක ගැනීමේ සහතිකයක් තිබීම පුද්ගල ආරක්ෂණයේ වැදගත් ස්ථානයක් ගනී.

**<u>පරපුර</u>** පිරිසිදුව හා නිවැරදිව පවත්වා ගෙන යෑම ෂරිආ පිළිවෙතේ ඉතා වැදගත් අංගයක් වෙයි. විවාහයට පූර්ව හා ඉන් බාහිර සියලුම ලිංගික සම්බන්ධතාවන් තහනම් වන අතර ඒවා දඬුවම් ලැබීමට හේතු වන කරුණු ලෙස සලකයි. අවිවාහ මෛථුනය, අනාචාරය, ලිංගික අපචාරය, ගණිකා වෘත්තිය ආදී සියලුම ආකාරයේ ලිංගික වැරදි මෙන්ම එම වැරදි කරා යොමු කරවන සියලු සාධක පිළිබඳව ෂරිආ පිළිවෙත දැඩි විරුද්ධ ස්ථාවරයක සිටී.

ෂරිආ හි සියලු කරුණු ඉහත ක්ෂේත්‍ර පහ ඇතුළත අඩංගු වන්නේය.

<u>යහ සමාජයක් ගොඩ නැගීම හා සුරක්ෂිත කිරීම පිළිබඳ ඇති ප්‍රධාන කරුණු කුමක්ද?</u>

1. ආධ්‍යාත්මික හා සාරධර්ම සපිරි සමාජයක් ගොඩ නැගීම අභියෝගාත්මක මෙන්ම අති දුෂ්කර කාර්යභාරයකි.

2. එවන් යහ සමාජයක් පිරිහීමෙන් හා අපවිත්‍රනයෙන් ආරාක්ෂා කිරීම එය නිර්මාණය කිරීමට වඩා අති භාරදූර හා දුෂ්කර ක්‍රියාවකි.

3. මේ හේතුව නිසාම සමාජයේ යහ පැවැත්ම සහතික කිරීමට හා ආරක්ෂා කිරීමට නීති රීති මෙන්ම නිවැරදි මඟපෙන්වීමක් අත්‍යවශ්‍ය වෙයි.

4. මෙම ක්‍රියාවලියේදී පුද්ගලයා ආරක්ෂා කිරීමට වඩා සමස්ත සමාජය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමුඛ තාවක් දිය යුතු වෙයි.

5. සමාජ විරෝධී ක්‍රියාවකට මුල් වන පුද්ගලයෙකු පරිත්‍යාග (කැප) කොට සමස්ත ධාර්මික සමාජයම ආරක්ෂා කිරීමට කටයුතු කිරීම ඉස්ලාමයේ පිළිවෙතයි.

6. ඉස්ලාමීය නීති රීති සකස් වී ඇත්තේ සමස්ත සමාජයේ සුරක්ෂිතභාවයට ප්‍රමුඛතාව දී ඉන් පසු පුද්ගලයා ආරක්ෂා කිරීමේ කටයුත්තට යොමු වීමේ පිළිවෙත මතය.

## ෂරිආ පිළිවෙත කෙරෙහි පැවරෙන කාර්යභාරය කුමක්ද?

මනුෂ්‍ය ජීවිතයේ පහත සඳහන් කරුණු ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ඉස්ලාමීය ඉගැන්වීම් සකස්වී ඇත.

1. ජීවිතය පිළිබඳ අනුල්ලන්ඝනීයත්වය
2. මානව නිදහස

3. මිනිසත්සකම පිළිබඳ සැලකිල්ල හා උනන්දුව
4. මානව ගෞරවය
5. සදාචාරාත්මක හැසිරීම
6. යුක්තිය හා සාධාරණය
7. සාමය
8. පාරිසරික සුරක්ෂිතභාවය

*"(විශ්වාසවන්තයිනි,) ඔබ නීතිගරුක වන ලෙස ද හොඳ ක්‍රියාවන් කරන ලෙස ද ඥාතීන්ට උපකාර කරන ලෙස ද අල්ලාහ් සැබැවින්ම ඔබට නියම කරන්නේය. අවමානයට ලක් වන ක්‍රියාවන්, පාපයන්, අපරාධයන් ආදී දෑය (ඔබ කෙරෙන්) ඔහු තහනම් කරන්නේය. (මේ දෑය) ඔබ මතක තබා ගත යුතු යැයි ඔහු (අල්ලාහ්) ඔබට යහ අවවාද දෙන්නේය."* (16 : 90)

*"(විශ්වාසවන්තයිනි,) නීතිය අකුරටම පිළිපැදීමෙහි අල්ලාහ් වෙනුවෙන් ඔබ සාක්ෂි දරවු. මිනිසුන්ගෙන් එක් කොටසක් කෙරෙහි (ඔබ තුළ ඇති) ද්වේශය (ඔවුන්ට) අපරාධයක් කිරීමට ඔබව පොලොඹවා නොගනිවු. (කොපමණ ක්‍රෝධයන් තිබුණ ද) ඔබ නීතියම ක්‍රියාත්මක කරවු. එය බියබැතිමත්භාවයට ඉතා සමීප වන්නේය. (කුමන අවස්ථාවක දී වුවද) ඔබ අල්ලාහ්ටම බිය වවු. සැබැවින්ම අල්ලාහ් ඔබ කරන දෑ හොඳින් දන්නේය."* (5 : 8)

## ෂරිආ පිළිවෙතේ මූලාශ්‍රයන් කුමක්ද?

ෂරිආ හි ප්‍රධානතම මූලාශ්‍රය වන්නේ අල් කුර්ආනයයි. අල්ලාහ් (එකම සත්‍ය දෙවිඳුන්) ගේ සෘජු වදන් මෙහි අන්තර්ගත වන

අතර ලොව අවසන් වනතුරු පවතින එකම සත්‍යය දිව්‍යමය මාර්ගෝපදේශය ද මෙය වෙයි. අල් කුර්ආනයට පසුව 'සුන්නා' නමින් හැඳින්වෙන මුහම්මද් ධර්ම දූතයාණන්ගේ (දෙවිඳුන්ගේ ආශිර්වාදය හා සාමය එතුමන් කෙරෙහි ඇති වේවා) ක්‍රියා, ප්‍රකාශන හා අනුමත කළ දෑ අඩංගු දෙවන මූලාශ්‍රය වැදගත් වෙයි. මෙම කරුණු අඩංගු ග්‍රන්ථ (උදාහරණ: සහිහ් බුහාරි, සහිහ් මුස්ලිම්, ඉබ්නු මාජා, තිර්මිදී, නසායි, යනාදිය) ඉස්ලාමීය විද්වතුන්ගේ දැඩි සුපරීක්ෂාවට භාජනය කොට පිළිගත් වර්ගීකරණයක් අනුව සකස් කොට තිබේ. 'හදීස්' යන අරාබි වචනයට ප්‍රකාශනය, වදන, සිදුවීමක්, අලුත් යන අර්ථ ඇති අතර මෙම වචනය සුන්නා යන සංකල්පයට සමාන අරුත් ඇති පදයක් ලෙස භාවිත කෙරේ. සුන්නාව අන්තර්ගත ග්‍රන්ථ හඳුන්වන්නේ ද හදීස් ග්‍රන්ථ ලෙසිනි. අල් කුර්ආනය හා සුන්නාවට අමතරව 'ඉජ්මා' (සම්මුතිය, එකඟතාව) 'කියාස්' (සමාකෘතිය, සමාකාර පොදු දෙයින් සුවිශේෂය නිගමනය කිරීම), ඉජ්තිහාද් (තර්කනය හා විචාරය) හා මස්ළහ (මහජන හා පොදු යහපත) ආදී කරුණු ද ෂරිආ පිළිවෙතේ මූලාශ්‍රයන් ලෙස සැලකේ.

## දහම හා ෂරිආ ව අතර ඇති වෙනස කුමක්ද?

නීති පද්ධතියක්, නියාමනයන්, යහ ඉගැන්වීම්, හා මුස්ලිම් වරුන්ගේ ජීවිතය හසුරුවන යහ අගයන් ෂරිආවෙන් අදහස් වේ. නැමදුම්, සදාචාරයන්, පුද්ගල චර්යාවන් හා ක්‍රියාකාරකම් මෙන්ම දේශපාලනික, සමාජයීය, ආර්ථික, අපරාධ හා සිවිල් ක්ෂේත්‍රයන් මෙයට අඩංගු වේ. දෙවිඳුන්ගේ සියලු ධර්ම දූතයින් මගින් ඉදිරිපත් කරනු ලැබුවේ එකම දහමක් වුවත් ෂරිආ වේ මූලික හරය ද එකක් වුවත් පරිවාර නීති හා ඉගැන්වීම් විවිධ ධර්ම දූතයාණන්හට පහළ කරනු ලැබූ පණිවිඩයන් තුළ සමාජයෙන් සමාජයට වෙනස් විය. උපවාස ශීලය අල්

කුර්ආනය අනුව මෙයට පෙර විසූ ජනයාට ද අනිවාර්ය වූවක් බව සඳහන්කොට ඇත. නමුත් සැමටම නියම වූ උපවාස ශීලයේ හරය එකක් වුවත් කලින් කලට එහි චර්යාවන් පිළිබඳ වෙනස්කම් සිදු කෙරිණ. උපවාස ශීලයේ දෛනික කාල පරාසය හා සම්පූර්ණ දින ගණන පිළිබඳව වෙනස්කම් ද දෙවිඳුන් විසින් සිදු කෙරිණ.

ඉස්ලාමයට අනුව මුළුමහත් මනුෂ්‍ය වර්ගයාටම නිවැරදි මග පෙන්වීම් අඩංගු සත්‍යය දහම ලැබිය යුත්තේ විශ්වයේ අධිපති සත්‍ය වූ එකම දෙවිඳුන්ගෙන් පමණි. කාල වකවානුව, ප්‍රදේශය, වාර්ගිකත්වය හෝ අන් සාධක පිළිබඳව තැකීමකින් තොරව මිනිස් ස්වභාවය හා ප්‍රධාන මිනිස් ක්‍රියාකාරකම් බොහෝ දුරට සමානය. මෙම කරුණ පදනම් කර ගෙන සකල මනුෂ්‍ය වර්ගයාගේම සියලු අවශ්‍යතාවන් උදෙසා සත්‍යය දෙවිඳුන්ගෙන් එකම දහමක් පමණක් පහළ වීම විචාරයට හා චින්තනයට පිළි ගත හැකි කරුණක් ව පවතී. මෙම දහම ඉස්ලාම් ය. ඉස්ලාමය මුහම්මද් ධර්ම දූතයාණන් (එතුමා කෙරෙහි දෙවිඳුන්ගේ ආශිර්වාදය හා සාමය අත්වේවා) විසින් පමණක් උගන්වන ලද්දක් නොවේ. මුහම්මද් තුමානන්ට පෙර සිටි ඒබ්‍රහම්, මෝසෙස්, ජේසුස් ඇතුලත්ව සියලු ධර්ම දූතයින් විසින් (එතුමන්ලා සැමට දෙවිඳුන්ගේ ආශිර්වාදය අත්වේවා) උගන්වන ලද දහම ඉස්ලාම් ය. ආගමික අර්ථ දැක්වීම අනුව ඉස්ලාම් යනුවෙන් අර්ථවත් වන්නේ විශ්වයේ අධිපති සත්‍ය වූ එකම දෙවිඳුන්ට යටහත් වීම, කීකරු වීම, අවනත වීම යනාදී වදන් වලින් විග්‍රහ වන පරිදි දෙවිඳුන්ගේ සත්‍යය මග පෙන්වීම අනුව තමන්ගේ ජීවිතය සකස් කර ගැනීමට එකඟ වීමය.

ඉස්ලාමීය සංකල්පය අනුව දහම යනු අධ්‍යාත්මික හා බුද්ධිමය අවශ්‍යතාවක් පමණක් නොව සමාජයීය මෙන්ම විශ්වීය අවශ්‍යතාවකුත් වන බවය. ඉස්ලාමයෙන් තොරව මිනිසාට

මිහිතලයේ මෙන්ම මරණින් මතු ජීවිතයේ ජය අත්පත් කර ගැනීමට අන් මගක් නොමැත්තේය.

## ෂරිආ පිළිවෙත හා ආචාරධර්මී මූලධර්ම අතර ඇති සබඳතාව කුමක්ද?

අනාගමික (Secular) පිළිවෙත හා ආචාරධර්මී මූලධර්ම අතර අනිවාර්ය අන්තර් සබඳතාවක් දකින්නට නොමැත. නමුත් ෂරිආ පිළිවෙත හා ආචාරධර්මී මූලධර්ම අතර සෘජු සම්බන්ධතාවක් අනිවාර්යයෙන්ම ඇත. ෂරිආ පිළිවෙත මගින් පුද්ගලයා තුළ හා සමාජයේ යහ සාරධර්ම සම්මතයන් හා ප්‍රමිතියන් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම ප්‍රධාන අරමුණක් බවට පත් ව ඇත. ෂරිආ හි අරමුණු පිළිබඳ ව ඉහතින් කරුණු පැහැදිලි කිරීමේදී ෂරිආ ක්‍රියාකාරකම් අන්තර්ගත වන ක්ෂේත්‍ර පහක් සඳහන් කළෙමු. එම සෑම ක්ෂේත්‍රයකම කටයුතු සදාචාර හා සාරධර්ම සපිරි ආකාරයෙන් සකස් කිරීම ෂරිආ පිළිවෙතේ මූලික වගකීමක් වෙයි. යුක්තිය හා සාධාරණය, අයිතිවාසිකම්, වගකීම්, අන්‍යෝන්‍ය අදහස් විචාරණය, මහජන හා පොදු යහපත, මෙලොව හා මතුලොව ජීවිතයන් හි සඵලත්වය ෂරිආ පිළිවෙතේ පොදු ඉලක්කයන්ය.

## 'හුදූද්' යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

'හුදූද්' යනු 'හද්' හි බහු වචනයයි. මෙම වචන දෙකම අරාබි භාෂාවට අයත් වන අතර මෙහි අර්ථය 'සීමාව' හෝ 'මායිම' යන්නය. මෙම වචනයට ඉස්ලාමීය කෝණයෙන් අර්ථවත් වන්නේ දෙවිඳුන් විසින් නියම කොට ඇති සීමාවන් උල්ලංඝනය කළ විට දරන්නට සිදුවන ආදීනවයන් (දඬුවම්)ය. මෙම දඬුවම් වර්ගීකරණය අනුව අධිකරණයකදී චූදිතයා නිශ්චිත වරදට වැරදි කරුවෙකු බවට ඔප්පු වුවහොත්, විනිශ්චයකරුට හෝ පාලකයාට හෝ වෙන අන් අයෙකුට හෝ

චූදිතයාට සමාව දීමේ අයිතියක් නොමැත. මෙහිදී නිශ්චිත දඬුවම් අනිවාර්යයෙන් දිය යුතුම වෙයි.

## ෂරිආ පිළිවෙත ක්‍රියාත්මක කිරීම යනු හුදුද් (නිශ්චිත දඬුවම්) ක්‍රියාත්මක කිරීමද?

ෂරිආ පිළිවෙත හුදුද් (නිශ්චිත දඬුවම්) පිළිබඳව පමණක් වූ සංකල්පයක් නොවේ. මුස්ලිම් වරයෙකුගේ ජීවිතයේ සියල්ලම පාහේ ෂරිආ පිළිවෙතට අනුකූල විය යුතුය. හුදුද් ක්‍රියාත්මක කිරීම යනු ෂරිආ හි කොටසක් ක්‍රියාත්මක කිරීම පමණි. දඬුවම් පිළිබඳව ඇති කොටස අති මහත් වූ ෂරිආ පිළිවෙතේ ඉතාමත්ම අල්ප වූ කොටසක් පමණි. හුදුද් යනු දෙවිඳුන් විසින් සෘජුව නියම කොට ඇති දඬුවම් වන අතර මෙයට අමතරව ‘කිසාස්’ (සමප්‍රතිචාර දැක්වීමේ නීතිය) හා ‘තා’Zසීර්’ (අධිකරණයේ අභිමතය හා විචාරශීලිත්වය මත පදනම් වූ නීතිය) ද ඉස්ලාමීය නීති පද්ධතියේ කොටසක් වන්නේය. මෙම පිළිවෙතට මුහම්මද් ධර්ම දූතයාණන් ගේ (එතුමා කෙරෙහි දෙවිඳුන්ගේ ආශිර්වාදය හා සාමය අත්වේවා) අලංකාර පූර්වාදර්ශයේ හා අල් කුර්ආනයේ ඉගැන්වීම් තුළින් මග පෙන්වීම් ලැබී ඇත. තවත් ලිපියකින් (ඉන්ෂා අල්ලාහ්) මෙම සියලු නීති පද්ධති පිළිබඳව සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන්නෙමු.

## කිසාස් හා තා’Zසීර් පිළිබඳව කරුණු පැහැදිලි කරන්න

ජීවිත ආරක්ෂණය සෑම සංස්කෘතියකටම පොදු වුවාක් මෙන්ම කෙනෙකුව නිකරුණේ මරා දැමීම බරපතළ වරදක් ලෙස ද සැලකේ. ඒ පිළිබඳව ඇති ඉස්ලාමීය මතයන් හා ක්‍රියාකාරකම් අන් සංස්කෘතීන්ට වඩා වෙනස් වන්නේ කෙලෙස ද යන්න පළමුව විමසා බලමු. හුදුද් කිසාස් හා තා’Zසීර් පිළිබඳව

සවිස්තරාත්මක කරුණු පැහැදිලි කිරීමක් තවත් ලිපියකින් (ඉන්ෂා අල්ලාහ්) කිරීමට අපේක්ෂා කරණ හෙයින් මූලික හැඳින්වීමක් පමණක් මෙහිදී කරන්නට බලාපොරොත්තු වන්නෙමු.

ජීවිතයේ අවසානය වූ මරණය සිදුවන හෝ සිදුවීමට නියම කරනු ලබන ආකාරය පිළිබඳව ඉස්ලාමය දරණ මතය අනුව එහි ජීවිතාරක්ෂණය සම්බන්ධයෙන් ඇති කරුණු සාකච්ඡාවට බඳුන් කළ හැක. මෙම කරුණු කියවන අයෙකුට නිවැරදි ඉස්ලාමීය ස්ථාවරයන් අවබෝධ කර ගැනීමට නම් එයටම සුවිශේෂී වූ ලක්ෂණයන් කිහිපයක් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම සුදුසු යැයි සිතන්නෙමු.

එවැනි ලක්‍ෂණයන්ගෙන් කිහිපයක් පහතින් ඉදිරිපත් කර ඇත්තෙමු.

1. තාපස, ශ්‍රමණ, අනගාරික, හෝ බ්‍රහ්මචාරී පිළිවෙතක් ඉස්ලාමයේ නොමැත.

2. පූජක පක්ෂයක් ඉස්ලාමයේ නොමැත. මව්ලවි, ආලිම්, යන අරාබි වචනයන්ගෙන් හඳුන්වන්නේ ඉස්ලාමීය විද්වතුන් වන අතර ඔවුන් සාමාන්‍ය ලෞකික ජීවිතයක් ගත කරන ගිහි පිරිසකි. සියලු නැමදුම් විශ්වයේ හා එහි අඩංගු සියලු දෑහි නිර්මාතෘ, අධිපති, පාලක, හා පෝෂක වූ අල්ලාහ් ටම පමණක් සිදු කළ යුතුය.

3. විවාහය දිරි ගන්වයි.

4. සියලු ඉගැන්වීම් දේව සවිඥාණක යහ ලෞකික ජීවිතයක් තුළින් මතු ජීවිතයේ සාර්ථකත්වය අත්පත් කර ගැනීම කෙරෙහි යොමු වී ඇත.

ඉහතින් සඳහන් කර ඇති මූලික වශයෙන් ඉස්ලාමයට පමණක් සුවිශේෂී වූ අදහස් පදනම් කර ගනිමින් ජීවිතාරක්ෂණය පිළිබඳව වූ කරුණු සාකච්ඡා කරමු. මේ පිළිබඳව ඇති අල් කුර්ආන් වැකියක් පළමුව විමසා බලමු.

"*යමෙක් තව අයෙකුව ඝාතනය කිරීමට හෝ මිහිතලය මත කලහකම් පැතිර වීමට දඬුවම් වශයෙන් හැර මිනිසෙක්ව (නිකරුණේ) මරා දැමීම මුළු මහත් මිනිස් වර්ගයාම මරා දැමීමට සමාන වන්නේය. එලෙසම යමෙක් මිනිස් ජීවිතයක් බේරා ගනීද ඔහු මිනිස් වර්ගයාම බේරා ගත්තා හා සමානය.*"(අල් කුර්ආනය 5:32)

ඉහත අල් කුර්ආන් වැකියෙන් මිනිසෙකු නිකරුණේ ඝාතනය කිරීම මුළු මහත් මනුෂ්‍ය වර්ගයාම ඝාතනය කිරීමකටද, එලෙසම යමෙක් මිනිස් ජීවිතයක් ආරක්ෂා කර ගනීද එය මුළු මහත් මනුෂ්‍ය වර්ගයාම ආරක්ෂා කර ගැනීමකටද සමාන කිරීමෙන් ජීවිත ආරක්ෂණය සහතික කිරීම ඉස්ලාමයේ සම්මත සංකල්පය බව ඉතා නිරවුල් ව පැහැදිලි වෙයි. මෙම සම්මත සංකල්පයට පටහැනි වන හෙතුන්ද මෙම අල් කුර්ආන් වැකියෙහි අන්තර් ගත කොට ඇති හෙයින් අපගේ සාකච්ඡාවට බඳුන් විය යුත්තේ එම කරුණු බවයි අපගේ අදහස වන්නේ. ඉස්ලාමීය ඉගැන්වීම් යහ ගිහි ජීවිතයක් කරා යොමු වී ඇති හෙයින් ඉස්ලාමීය රාජ්‍යයක නීතිය හා සාමය පවත්වා ගෙන යෑමේ මඟ පෙන්වීමද එයට ඇතුලත්ව ඇත. නීතිය හා සාමය

පවත්වා ගෙන යැමද ජීවිත ආරක්ෂණය පදනම් කරගෙන සකස් වූවකි.

## මිනිස් ඝාතන

"*අවබෝධ කරගන්නෙනි, 'කිසාස්' (සම ප්‍රතිචාර දැක්වීමේ නීතියෙ) හි ජීවිතයක් (සුරැකෙනු) ඇත; නුඹලා (ඝාතනයෙන් දුරස්ථවී) බිය බැතිමත් වනු පිණිස*" (අල් කුර්ආනය 2:179)

'කිසාස්' (සම ප්‍රතිචාර දැක්වීමේ නීතිය) අනුව 'ජීවිතයක් ඇතැයි' යනුවෙන් දෙවිඳුන් අවධාරණය කරනුයේ චේතනීය මිනී මැරුමකට ඝාතකයාට මරණ දඬුවම ලබා දීම හා එය ප්‍රසිද්ධියේ ක්‍රියාත්මක කිරීම මගින් එය සෙසු අයට එවැනි නොමනා ක්‍රියාවකට පෙලඹීමට ඇති නැඹුරුව නසා දැමීම සඳහා වූ අවවාදාත්මක ක්‍රියාවක් වන හෙයිනි. මෙමගින් සමාජයේ ඝාතන සඳහා වූ නැඹුරුව හා එවැනි මානසිකත්වය ඉවත් වී ගොස් ජීවිත සුරක්ෂිත කිරීමේ තත්වයක් නියත වශයෙන්ම උදා වනු ඇත.

ඉහත දඬුවම නියම කර ඇත්තේ සචේතනීය මිනීමැරුමක් සඳහාය. මේ සම්බන්ධයෙන්ද ලොව කිසිම නීති ක්‍රමයක නොමැති මානුෂීය හා ජීවිතාරක්ෂණය සහතික කරන වගන්ති ඉස්ලාමීය නීතියෙහි අඩංගු වී ඇත.

"*විශ්වාස කළවුනි, ඝාතනය කරනු ලැබුවන්ගේ විෂයයෙහි කිසාස් (සම ප්‍රතිචාර දැක්වීමේ නීතිය) අනිවාර්යය කරනු ලැබ ඇත; නිදහස් පුද්ගලයාට නිදහස් පුද්ගලයාද, වහලෙකුට වහලාද, ස්ත්‍රියකට ස්ත්‍රිය ද (මරණ දණ්ඩනයේ*

*නීතීන්ට යටත්) වේ; එනමුත් තම (ඝාතනයට ලක් වූ තැනැත්තාගේ) සහෝදරයා විසින් කවරෙකු(ඝාතකයා) ට යම් කිසි සමාවක් දෙනු ලබන්නේද ඔහු (ඝාතනයට ලක් වූ තැනැත්තාගේ සහෝදරයා එවිට වන්දි මුදල සම්බන්ධයෙන්) සාධාරණත්වය අනුගමනය කළ යුතුය; තවද ඔහු(ඝාතනයට ලක් වූ තැනැත්තාගේ සහෝදරයා) වෙත යහපත් අයුරින් (වන්දිය) ඉටු කළ යුතුය; එය නුඹලාගේ පරමාධිපතිගෙන් වූ සහනයකි, තවද කරුණාවකි; ඉන් පසුව කවරෙකු හෝ සීමාව ඉක්මවා යන්නේ නම් ඔහුට වේදනීය දඬුවමක් ඇත.*" (අල් කුර්ආනය 2:178)

ඉහත අල් කුර්ආන් වැකියට අර්ථ දක්වන ඉස්ලාමීය විද්වතුන්ගේ මතය සංක්ෂිප්තව පහතින් දක්වා ඇත්තෙමු.

1. මිනිස් ඝාතනයකදී අගතියට පත් පාර්ශවයට සම ප්‍රතිචාර දැක්වීමේ නීතිය යටතේ ඝාතකයාට මරණ දඬුවම දෙන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටීමේ අයිතිය ඇත.

2. දෙවන විකල්පය වශයෙන් 'දියා' යනුවෙන් හැඳින්වෙන වන්දි මුදලක් ලබා ගෙන ඝාතකයාට සමාව දීමේ අයිතියද අගතියට පත් පාර්ශවයටම ලබා දී ඇත. මෙය පොදුවේ සිදුවෙන රටේ පාලකයා විසින් හෝ ඉහළ උසාවියකින් දෙනු ලබන සමාව හා සම නොවේ.

3. වන්දි මුදලක් ලබා නොගෙනද සමාව දීමේ අයිතිය අගතියට පත් පාර්ශව කරුවන්ට ලබා දී තිබේ.

ඝාතනයට ලක් වූ පුද්ගලයා පවුලේ ආර්ථික වගකීම දරන පුද්ගලයා වූ විට ඇති වන තත්වය අති භයානකය. මෙවන් අවස්ථාවකදී අගතියට පත් පාර්ශවය තම ඥාතියා අහිමි කරගත්තා පමණක් නොව තම යැපීම් මාර්ගයද අහිමි කර ගත් තත්වයට පත් වෙයි. මෙය සැබැවින්ම කබලින් ලිපට වැටීමේ තත්වයකි. ඉස්ලාමීය නීතිය තුළ අධිකරණය මරණ දඬුවම නියම කළ ද එහි අවසාන නිගමනය අගතියට පත් පාර්ශව කරුවන්ට ලබා දී තිබේ. මෙහි අඩංගු සර්ව සාධාරණීයත්වය අපට ප්‍රතික්ෂේප කළ නොහැක්කකි.

ඇතැම් මූලාශ්‍රයන් උපුටා දක්වමින් සම ප්‍රතිචාර දැක්වීමේ නීතිය මුස්ලිම් නොවන අයෙකු ඝාතනය කිරීමේදී බලනොපවත්වන බව විවිධ පාර්ශවයන් අදහස් ඉදිරිපත් කරති. මෙය සම්පූර්ණයෙන්ම සාවද්‍ය අදහස් දැක්වීමකි. රියාද් විශ්ව විද්‍යාලයේ ඉස්ලාමීය නීතිය පිළිබඳව මහාචාර්ය ධුරය දැරූ මොහමඩ් එස් එල්අවා මහතා විසින් තමන්ගේ ආචාර්ය උපාධිය සඳහා ලන්ඩන් විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කළ පර්යේෂණාත්මක නිබන්ධයේ (Punishment in Islamic Law by Professor Mohammed S. El-Awa) 130 වන පිටුවේ අදහස් දැක්වීම සඳහා එක් ඡේදයක් 'මුස්ලිම් නොවන අයෙකු ඝාතනය කළ විට සම ප්‍රතිචාර නීතිය මුස්ලිම් වරයෙකුට එරෙහිව බල පවත්වන අයුරු' (Qisas Against a Muslim for killing a Non-Muslim) යන මාතෘකාව යටතේ වෙන් කොට ඇත. මෙම නීතිය සර්ව සාධාරණීය එකක් ලෙස අල් කුර්ආනය පැහැදිලි කොට තිබියදී කෙලෙස නම් එය මුස්ලිම් නොවන්නෙකු විෂයයෙහි බලරහිත කරවන්නේ ද කියා එතුමා ප්‍රශ්න කරයි.

ඉහත අල් කුර්'ආන් වැකි එනම් 2:178 හා 5:32 පොදුවේ මනුෂ්‍ය වර්ගයාට බල පවත්වන ආකාරයේ නියෝගයන්ය.

එහෙයින් සමහර කුරාන් වැකි හා නබි වදන් විශ්වාසවන්තයෙකුව ප්‍රතික්ෂේප කරන්නෙකුට වඩා ශ්‍රේෂ්ඨත්වයේ සලකා අදහස් ඉදිරිපත් කොට තිබුණද, නීතිය ඉදිරියේ සැවොම සමාන ලෙස සැලකීම ඉස්ලාමීය නීතියේ සම්මතයයි. සත්‍යය, සාක්ෂි මත පදනම් වී විනිශ්චය කළ යුතු බව අල් බුහාරී හදීස් ග්‍රන්ථයේ වෙළුම් අංක 3 නබි වදන් අංක 638 මගින් නබිතුමාණන් උපදෙස් දී ඇත. තවත් වරෙක විනිශ්චයකරු කෝප වූ තත්වයේ සිටින අවස්ථාවේ තීන්දු නොදිය යුතු බව අල් බුහාරී හදීස් ග්‍රන්ථයේ වෙළුම් අංක 9 නබි වදන් අංක 272 මගින් නබි තුමාණන් තවදුරටත් උපදෙස් දී ඇත.

වැරදීමකින් එනම් අචේතනීය ඝාතනයක් ලෙස අධිකරණයට ඔප්පු වූ විට ඒ පිළිබඳව මරණ දඬුවම නියම කළ නොහැකිය. ඒ වෙනුවෙන් අගතියට පත් පාර්ශවයට වන්දි මුදල් ලබා දීම කළ යුතුව ඇත. සචේතනීය හා අචේතනීය ඝාතනයන්හි ඝාතකයා පශ්චාත්තාප වී දෙවිඳුන්ගෙන් සමාව ඇයද සිටිය යුතු බව ද ඉස්ලාමය උගන්වයි.

## <u>තාZසීර්</u>

තාZසීර් යන වචනය අZසාර් යන ක්‍රියා පදය මුල් කර ගෙන බිහිවුවකි. අZසාර් යන පදයේ අර්ථය වැළක්වීම, ගෞරව කිරීම, සහ ප්‍රතිසංස්කරණය හෝ පරිශෝධනය කිරීම වේ. කෙසේ නමුත් ඉස්ලාමීය නීති ක්‍රමයේ තාZසීර් යන වචනයෙන් අදහස් වන්නේ අපරාධකරුවෙකු ව තවදුරටත් අපරාධයෙහි නියැළීමෙන් වළක්වා ගැනීම හා ඔහුව ප්‍රතිශෝධනය කර ගැනීම අරමුණු කර ගත් දඬුවම් පිළිවෙතකි. තාZසීර් දඬුවම් පිළිවෙත හුදුද් හා කිසාස් පිළිවෙතට අඩංගු වන කරුණු පිළිබඳව විනිශ්චය සඳහා උපයෝගී කර ගනු නොලැබේ. හුදුද්

පිළිවෙත පිළිබඳව සවිස්තරාත්මවක තවත් ලිපියකින් කරුණු සාකච්ඡා කිරීමට අදහස් කරන හෙයින් එම පිළිවෙතට අදාළව විනිශ්චය කළ හැකි චෝදනා පිළිබඳව එම ලිපියෙන් කරුණු ඉදිරිපත් කිරීමට අදහස් කරන්නෙමු.

නීති පැනවීම අවශ්‍යය, එමෙන්ම සුදුසුය. එම නීති පනවන්නේ කුමක් සඳහා ද? සමාජයේ යහ පැවැත්ම උදෙසාය. ජනයාගේ පහසුව හා සුරක්ෂිතභාවය සඳහාය. වැරදි කරන්නවුන් හික්මවා ගැනීම සඳහාය. ඔවුන් යහපත් මිනිසුන් බවට පත් කර ගැනීම සඳහාය. සමාජයේ යහපත් වාතාවරණයක් ඇති කර ගනු සඳහාය. නීති පැනවීම තුළින් අපේක්ෂා කරනුයේ දඬුවමට බියෙන් වරදින් වැළකී සිටිනවා මෙන්ම, සෑම කෙනෙක්ම නීතිය යුක්තිය හා දඬුවම පිළිබඳව අවබෝධයක් ඇති කර ගෙන වැරැද්දට පෙලඹීමේ මානසිකත්වය ඉවත් කොට යහකම් කිරීමේ මානසිකත්වයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව සඳහාය. මෙවන් සමාජයක් සදාචාර සම්පන්න පුද්ගලයන්ගෙන් සමන්විත උදාර සමාජයක් වශයෙන් හැඳින්විය හැක.

## හුදූද් (නිශ්චිත දඬුවම්) නොදී වඩාත් උචිත වන්නේ චූදිතයාව ප්‍රතිශෝධනය කර ගැනීම නොවේද?

වර්තමාන ලෝකයේ ඉස්ලාමීය දඬුවම් පිළිවෙතට විරුද්ධව හඬ නගන්නන්ගෙන් බහුතරයකගේ මතය වී ඇත්තේ එය අමානුෂික පිළිවෙතක් වන බවට නගන චෝදනාවයි. මෙයට ඉහත පැහැදිලි කළ ආකාරයට කිසාස් සහ තාZසීර් පිළිවෙත් හි ලොව අන් කිසිම නීති පද්ධතියක නොමැති මානුෂීය හා සාධාරණීය බවක් දක්නට ඇති බව ඔබට පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන්නෙමු. ඉස්ලාම් විරෝධීන්ගේ ප්‍රධාන විරුද්ධතාව මතු වී ඇත්තේ හුදූද් (නිශ්චිත දඬුවම්) පිළිවෙතට ය. අප මෙම

ලිපියේ ආරම්භයේ සඳහන් කළාක් මෙන් ඉස්ලාමයට එරෙහි බොහෝ චෝදනා මතු වී ඇත්තේ අනවබෝධය පදනම් කර ගෙන බව ඉතාමත්ම පැහැදිලිය. ඉස්ලාමීය සියලු දඬුවම් සකස් වී ඇත්තේ ඉතාමත්ම විද්‍යානුකූල පදනමක් මත බව කරුණු විචාරා දැන ගැනීමෙන් පසු නිශ්චිතවම පැහැදිලි වනු ඇත. නූතන වෛද්‍ය විද්‍යාව සකස් වී ඇත්තේ රෝග වළක්වා ගැනීම පිළිබඳව දැඩි අවධානයකින් යුක්තවය. වඩාත් උචිත වන්නේත් එය බව ඕනෑම අයෙකුට තර්කයෙන් තොරව පිළිගැනීමට හැකි සත්‍යයකි. රෝග නිවාරණය හෙවත් ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක වන්නේ රෝගය වැළඳීමෙන් පසුවය. මෙයින් ඔප්පු වන ප්‍රධානතම සත්‍යය වන්නේ රෝග වළක්වා ගැනීම නූතන වෛද්‍ය විද්‍යාවේ ප්‍රධානතම සංකල්පය බවය. එලෙසම ඉස්ලාමයේ මූලික අවධානය යොමු වී ඇත්තේ මුළු මහත් මනුෂ්‍ය වර්ගයාවම සදාචාර හා සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කර ගැනීමටය. මෙම ලිපියේ ආරම්භයේදීම ෂරිආ පිළිවෙතේ අරමුණු ඉදිරිපත් කිරීමේදී කරුණු පහක සුරක්ෂිතභාවය පිළිබඳව කරුණු ඉදිරිපත් කළෙමු.එනම්, දහම, ජීවිතය, බුද්ධිය, ධනය හා පරපුර සුරක්ෂිත කිරීම ෂරිආ පිළිවෙතේ මූලික අරමුණු වෙයි. මෙම අරමුණු විග්‍රහ කරන ඉස්ලාමය මෙම කරුණු පහ සුරක්ෂිත කිරීම සඳහා සැමට පිළි ගත හැකි, සැමට අනුගමනය කළ හැකි හා ප්‍රායෝගි වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරයි.

නූතන සමාජය වසංගතාකාරයෙන් ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර සිදුවෙමින් පවතී. මෙවන් තත්වයක් ඇතිවීමට කරුණු රාශියක් විග්‍රහ කරන්නට ඇති අතර ඉතා කෙටියෙන් පවසන්නේ නම් සමාජයේ සිදුවෙමින් පවතින සදාචාර පිරිහීම මෙයට ප්‍රධාන හේතුවක් බවට පත් වී ඇත. ස්ත්‍රී පිරිමි ලිංගික ක්‍රියාවලිය සිදුවන්නේ පිරිමියාගේ ලිංගික උත්තේජනය මුල් කර ගෙනය. පිරිමියාගේ ලිංගික උත්තේජනයෙන් තොරව ලිංගික

ක්‍රියාවලියක් සිදු නොවන බවට අමතර අටුවා ලියන්නට අවශ්‍යතාවක් නොමැති බව සැවොම පිළිගන්නා සත්‍යයකි. මෙම මාතෘකාව සාකච්ඡා කිරීමේදී ලිංගික උත්තේජන පිළිබඳව ඇති විද්‍යාත්මක විග්‍රහය කුමක්ද යන්න අප දැන ගැනීම වැදගත් වනු ඇත.

මිනිසා බඳු විෂම ලිංගික (hetero sexual) සත්වයින් තුළ ලිංගික හැඟීම් ඇති වන්නේ එක්තරා අන්තරාසර්ග ග්‍රන්ථියකින් වහනය වන හෝර්මෝන වර්ගයක් නිසා බව පර්යේෂණාත්මක මනෝවිද්‍යාවෙන් හා ජීව-රසායන විද්‍යාවෙන් පෙන්වා දී තිබේ. අධිලිංගිකතාව හෝ අවලිංගිකතාව මේ ග්‍රන්ථි වල අධික්‍රියාකාරිත්වය හෝ අවක්‍රියාකාරිත්වය මත කෙළින්ම රඳා පවතී.

ප්‍රති විරුද්ධ ලිංගිකයන්ගේ දර්ශනය, ගන්ධය, ස්පර්ශය, ශබ්දය ආදී ඉන්ද්‍රිය ග්‍රහණ නිසා හෝ ඒ සම්බන්ධ වෙනත් දෙයක් නිසා හෝ සිතේ ලිංගික හැඟීම් පිබිදේ. මෙහි ප්‍රතිඵලය ලෙස චාලක ස්නායු ඔස්සේ ලිංගික ග්‍රන්ථි කරා විද්‍යුත් ආවේග ගමන් කරයි. එවිට එම ග්‍රන්ථි වලින් රුධිරයට හෝර්මෝනය වහනය වෙයි. රුධිර සංසරණය මගින් මොළය දක්වා එන මෙම හෝර්මෝන පුද්ගලයාගේ සිතුවිලි තවත් පුබුදු කරයි. ජීව විද්‍යාත්මක සාධකයක් වන මෙම චිත්තවේග මර්දනය කිරීම පුද්ගලයාට කරන්නට අති දුෂ්කරය. ඒ හේතුවෙන් ඔහුට සියලු සදාචාර නීති අමතක වෙයි. වර්තමාන සමාජය දෙස බලන විට පිරිමියාගේ ලිංගික උත්තේජනයට උඩගෙඩි දෙන ආකාරයේ ස්ත්‍රී හැසිරීමක් තිබෙනවාද නැද්ද යන්න අපි ඔබගෙන් අසන්නට කැමැත්තෙමු. තවද නූතන මනෝ විද්‍යාව අපට උගන්වන්නේ පුරුෂයින්ට හා ස්ත්‍රීන්ට ලිංගික උත්තේජනය සිදුවන ආකාරයේ වෙනසක් ඇති බවය. අඩු ඇඳුමින් සැරසුණු පිරිමියෙකු දැකීමෙන් ස්ත්‍රියකගේ මනසේ ලිංගික පිබිදීමක් ඇතිවන්නේ

ඉතාමත්ම අල්ප වශයෙන් බවත් ස්පර්ශය තුළින් ඇගේ හැඟීම් අවදි වීම ඉතා අධිකව සිදුවන්නක් බවත් මනෝ විද්‍යා සොයා ගැනීමකින් තොරව වුවත් අප අත්දකිනා සත්‍ය කරුණකි. අනෙක් අතින් අඩු ඇඳුමින් සැරසුණු ස්ත්‍රියකගේ ශරීරය දැකීමෙන් පිරිමියෙකුගේ සිත තුළ ඇති වන රාගික හැඟීම් ඉතාමත්ම අධික බවත් අප දන්නා සත්‍යයකි. නැවත වරක් අප පැවසිය යුතුව ඇත්තේ තමන්ගේ මව, බිරිය, දියණිය හෝ සොයුරිය මහ මඟ බහුතරයකගේ රාගික හැඟීම් ඇවිස්සීමේ ආධාරකයක් බවට පත්වීම සදාචාර සම්පන්න කිසිම පිරිමියෙක් අනුමත කරන ක්‍රියාවක් නොවන බවය. නමුත් පිටස්තර ස්ත්‍රීන් එසේ තමන්ගේ රාගය ඇති කරවන භාණ්ඩයක් බවට පත්වීම අපේක්ෂා කරන පිරිමින්ද අප සමාජයේ දක්නට ලැබෙන පොදු ලක්ෂණයක් බව පැවසිය යුතුව ඇත. මෙවන් 'රෑ දනියෙල් දවල් මිගෙල්' චරිත නිසා සිදු වී ඇති හානිය ඉමහත්ය. මනසේ මවා ගත් හරයක් නැති මතවාදයන් ඉදිරිපත් කරමින් සමාජය නොමඟ යවන්නට යමෙක් කටයුතු කරයි නම් එය ඉතාමත්ම පහත් ක්‍රියාවකි.

පිරිමියෙකුට තම පෙකණියේ සිට දණහිස වැසෙන පරිදි ඇඳුමක් ඇඳීම සදාචාර විරෝධී ක්‍රියාවක් ලෙස කිසිවෙක් දකීවියි අපි නොසිතන්නෙමු. නමුත් එම ඇඳුම ස්ත්‍රියකට කෙසේ නම් සුදුසු විය හැකිද? පෙකණියේ සිට දණහිස දක්වා ඇඳුමක් ඇඳගත් පිරිමියෙකු තම ගෙවත්තේ වැඩ කරන විට එය අසලින් යන පිටස්තර ස්ත්‍රීන්ට ඔහු ලිංගික ආකර්ෂණයක් නොවන බව අපි ඉතාම හොඳින් දනිමු. නමුත් එම ඇඳුමම ඇඳ ස්ත්‍රියක් එම කාර්යයේම නියැළුනහොත් සිදුවිය හැකි කලබැගෑනිය පිළිබඳව අමුතුවෙන් කිව යුතු වන්නේද? මෙයින් පෙනෙන්නේ ස්ත්‍රී පිරිමි දෙකොටසේම ඇඳුම් සම විය නොහැකි බව නොවේද?

සත්ව ලෝකයේ ඇඳුම් අඳින්නේ මිනිසා පමණි. මිනිසා සහ සත්ව ලෝකයේ අනිකුත් සතුන් අතර ඇති වෙනස්කම් අතුරින් ප්‍රධාන එක් වෙනස්කමක් ලෙස මෙය සැලකිය හැකිය. අප පමණක් මෙසේ කරන්නේ ඇයිද යන ප්‍රශ්නයට ලැබිය හැකි නිවැරදිම පිළිතුර වන්නේ මිනිසාට පමණක් උරුම වූ ලැජ්ජ බය මත පදනම් වූ සදාචාරය යැයි පැවසීම ඉතාමත් නිවැරදිය. එම නිසා ඇඳුම යනු සදාචාරය හා බැඳුනු ක්‍රියාවක් ලෙස අපට ඔප්පු වන සත්‍යයකි. සදාචාරය හා බැඳීමක් නොමැත්තෙකුට ඇඳුම් පිළිබඳ ගැටලුවක් බොහෝ විට නොමැති අතර ඇඳුමේ ප්‍රමාණය අඩුවෙන තරමට හෝ ඇඳුම් නොමැතිවීම හෝ හොඳ යැයි සිතීමට ඉඩ ඇත. අප යහ මිනිසුන් යැයි හඳුන්වන්නේ සදාචාර සම්පන්න වුවන්ට යැයි පැවසීම ලොව ඕනෑම සමාජයක් පිළිගන්නා වූ යථාර්ථයකි. සදාචාරය සෑම දහමකම මුලික පදනම ලෙස සැලකෙන්නේ එහෙයිනි.

වඩාත් අදහාගත නොහැකි කරුණ බවට පත් වී ඇත්තේ ස්ත්‍රියක් තමන්ගේ සංස්කෘතිය අනුව සදාචාර සම්පන්න ලෙස ඇඳුමින් සැරසී සමාජගත වන විට මතු කරන්නා වූ අවලාදයන් ගැනය. මෙවන් සදාචාර විරෝධී හඬ දහමක නමින් එන විට මුළු සමාජයම පත් වන්නේ කුමන තත්වයකටද? අසංවරකම ප්‍රගුණ කරන්නට දරන්නා වූ වෑයමක් ලෙස මෙය හඳුන්වාදිය නොහැකිද? දරුවන් ඇති යහ දෙමව්පියන් මේ පිළිබඳව දක්වන ප්‍රතිචාරය කුමක්ද? කාගේ හෝ සැඟවුණු න්‍යාය පත්‍රයකට අනුව හෝ තවත් ශ්‍රී ලාංකේය ජනවාර්ගික කොටසක් කෙරෙහි ඇති තමන්ගේ පදනම් විරහිත වෛරය නිසා හෝ යහ චින්තනයකින් තොරව සමාජ සදාචාරය පිරිහීමට දිරි දෙන අයුරින් කටයුතු නොකළ යුතු යැයි ඉතා නිහතමානීව අපි ඉල්ලා සිටින්නෙමු. නූතන වාණිජ සමාජය විසින් ස්ත්‍රීයව වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කර තිබීම ගැන කිසිම හඬක්

ඇසෙන්නේ නැත. ශරීරයෙන් 5% ක් පමණ වසා ගත් තරුණියන්ගේ රාගය දනවන රූප රාමු වෙළෙඳ දැන්වීම් වලට යොදා ගැනීම ගැන දහම් ගැන කථා කරන්නන් මුනිවත රකිමින් රහසිගත වින්දනයක යෙදී සිටින්නේදැයි අසන්නට තරම් කාරණයක් බවට පත් වී ඇත. කසාය බිව් ගොළුවන් සේ මෙම උදවිය කටයුතු කරන්නේ මන්ද? මෙවන් රූප රාමු වලට තම මව, බිරිය, සහෝදරිය හෝ දියණිය ඉදිරිපත් කරන්නට අපි අකැමැති වන්නෙමු. අවාසනාවට, පිටස්තර ස්ත්‍රීන්ගේ කාමුක දර්ශන දෙස බලා මානසික වශයෙන් රෝගී වින්දනයක් ලබාගන්නට සමහරුන් හුරු වී ඇති අතර මෙම රෝගයේම කොටසක් ලෙසින් තම ශරීරය සදාචාර සම්පන්න ලෙස වසාගන්නා වූ ස්ත්‍රීන්ට අවලාද නගන්නටද හුරු වී සිටිත්. සාරධර්ම හා සදාචාරයෙන් යුත් සමාජයක් ගොඩ නැගීම සඳහා වූ ඉස්ලාමීය ඉගැන්වීම් ගැන විරුද්ධත්වය පාමින් ඊනියා ස්ත්‍රී අයිතිවාසිකම් ගැන කතා කරන්නන්ගේ සැඟවුණු අරමුණු කුමක්ද යන්න දැන් පැහැදිලි වී ඇතැයි සිතන්නෙමු.

ස්ත්‍රිය පිළිබඳව ඉතා ගෞරවනීය ස්ථානයක් ලබා දෙන ඉස්ලාමය, ඇයගේ ගෞරවය සුරැකෙන පරිදි මඟපෙන්වීම් ද ලබා දී තිබේ. ඇගේ ඇඳුමේ ප්‍රමිතිය පිළිබඳව නිශ්චිත ඉගැන්වීම් ඉදිරිපත් කරන ඉස්ලාමය දහමින් අනුමත ආරක්ෂකයෙකු, භාරකාරයෙකු නොමැතිව දුර බැහැර ගමන් යෑමද වළක්වා ඇත. මෙසේ කර ඇත්තේ ඇගේ ශාරීරික දුබලතාව ප්‍රයෝජනයට ගෙන ඇයගේ ගෞරවය කෙලෙසෙන පරිදි කටයුතු කරන්නට ඉදිරිපත් වීමට ඉඩ ඇති සමාජ විරෝධීන්ගෙන් ඇයව ආරක්ෂා කර ගැනීමටය. මෙවන් පූර්ව ආරක්ෂක විධිවිධාන සලසා තිබියදීත් රෝගී මනසකින් යුක්ත පිරිමියෙකු ස්ත්‍රී දූෂණයට පෙලඹෙන්නේ නම් ඔහුට දඬුවම් දීම

පිළිබඳව විරුද්ධ විය හැක්කේ කා හටද? එම දඬුවම වඩාත් සැහැල්ලු වූයේ නම් දඬුවමේ අර්ථය පරාජය වනු ඇත.

ස්ත්‍රියගේ ආරක්ෂාවට මෙවන් පියවර ගන්නා ඉස්ලාමය යම් පිරිමියෙකුට එක් ස්ත්‍රියකගෙන් පමණක් තෘප්තිමත් වීමට නොහැකි නම් එක් වැදගත් කොන්දේසියක් මත දෙදෙනෙක් තිදෙනෙක් හෝ සතරදෙනෙක් දක්වා විවාහ කරගැනීමට අවසර ලබා දී තිබේ.

අනාදිමත් කාලයේ සිට පැවත ආ බහු ස්ත්‍රී විවාහය පිළිබඳව ඉස්ලාමයේ ස්ථාවරය පැහැදිලි කළ විට එමගින් කාන්තා අයිතිවාසිකම් පමණක් නොව කාන්තාවගේ ගෞරවය කෙතරම් දුරට සුරැකී ඇත්තේ දැයි අවබෝධ කර ගැනීමට හැකි වේ යයි සිතන්නෙමු. මේ පිළිබඳව ඇති අල් කුර්ආන් වැකිය විමසා බලමු.

*“අනාථයින් පිළිබඳව නුඹලා විසින් යුක්තිගරුකව කටයුතු නොකරනු ඇතැයි නුඹලා බිය වන්නෙහු නම් ස්ත්‍රීන් අතුරින් නුඹලාට ප්‍රියමනාප අය දෙදෙනා තිදෙනා සිව්දෙනා බැගින් විවාහ කර ගනිවු. නුඹලා විසින් සාධාරණය ඉටු නොවනු ඇතැයි නුඹලා බිය වන්නෙහු නම් එක් ස්ත්‍රියක් හෝ නුඹලාගේ දකුණත සතුකර ගත් (වහල්) අය (ප්‍රමාණවත්)ය. එය නුඹලා අසාධාරණකම් නොකිරීමට ඉතා සමීපය.”* (අල් කුර්ආන් 4::3)

අල් කුර්ආනය පහළ කළ යුගයේ, එනම් දැනට ශත වර්ෂ 14 කට පෙර අරාබි හා ලොව අනෙකුත් සමාජයන්හි ස්ත්‍රීන් අසීමිත සංඛ්‍යාවක් විවාහ කර ගැනීම සාමාන්‍යය සම්ප්‍රදාය බවට පත්ව තිබිණ. ඉහත අල් කුර්ආන් වැකිය මගින් මෙම

වැරදි සමාජ සම්ප්‍රදාය නිවැරදි කිරීමට ලොව පළමු පියවර හා මඟ පෙන්වීම ඉදිරිපත් කරන ලදී. එම යුගයේ ඉස්ලාමයට විරුද්ධව විවිධ යුද්ධ ඇතිවූ අතර සෑම යුද්ධයක් අවසානයේදීම පිරිමින් විශාල ප්‍රමාණයක් මිය යෑම හේතුවෙන් වැන්දඹු වූ ස්ත්‍රීන් හා අනාථ වූ දරුවන් විශාල පිරිසක් බිහි වූ අතර ඔවුන් රැක බලා ගැනීම සමාජයේ ජීවත් වුවන්ගේ වගකීම බවට පත්විය. මෙම වැකිය මගින් පළමුව දන්වා සිටින්නේ අනාථ දරුවන් යහ අයුරින් රැක බලා ගැනීමේ වගකීම නිසි ලෙස ඉටුකිරීම මුල් කරගෙන බහු ස්ත්‍රී විවාහය සඳහා යොමු වන ලෙසය. එවක මතු වූ සමාජ ප්‍රශ්නයක් සඳහා වූ විසඳුමක් ලෙසටයි මෙම අනුමැතිය ලබා දෙනු ලබන්නේ. ශ්‍රී ලංකාවේ මෑතකදී අවසන් වූ දශක තුනක ත්‍රස්තවාදී ගැටුම අවසානයේ දී ජීවිතයේ හෙටක් පිළිබඳ විශ්වාසය අහිමි වූ අති විශාල වැන්දඹු වූ කාන්තා පිරිසක් සමාජයට එකතු වී සිටිති. ඔවුන් සම්බන්ධයෙන් විසඳුමක් දීමට රටේ පවතින නීතියට හැකියාවක් නොමැත. ඔවුන් පිළිබඳව යහ විසඳුමක් ලබාදීමේ මඟ විවෘතවී ඇත්තේ ඉස්ලාමීය ඉගැන්වීම් තුළ පමණක් බව මෙම ලිපියේ කරුණු මධ්‍යස්ථව විමසා බලන අයෙකුට පෙනී යනු ඇත. යුද්ධයෙන් පසු ස්ත්‍රී පුරුෂ අනුපාතයද උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි වෙනස් වී ඇති බව සත්‍යයකි.

මෙමගින් බහු ස්ත්‍රී විවාහයකට අනුමැතිය ලබාදුන්නද ඒ සඳහා වැදගත් කොන්දේසි කිහිපයක් පනවා ඇත. මෙම වැකියෙන් මිනිස් ඉතිහාසයේ පළමු වරට බහු ස්ත්‍රී විවාහය හතර දක්වා සීමා කර ඇත. මෙම අල් කුර්ආන් වැකියේ ඉතාමත්ම වැදගත් කොන්දේසිය වන්නේ බහු ස්ත්‍රී විවාහය අනුමත වුවද තමන්ගේ බිරියන් අතර <u>යුක්තිය හා සාධාරණය</u> ඉටුකරන්නට නොහැකි කමක් ඇතැයි තමන් බිය වන්නේ නම් එක් ස්ත්‍රියක් පමණක් විවාහ කර ගන්නා ලෙස ය. එක් ස්ත්‍රියක් පමණක් විවාහ කර ගන්නා ලෙස උපදෙස් ලබාදෙන එකම ආගමික ග්‍රන්ථය ද අල්

කුර්ආනයයි. ස්ත්‍රීන් අතර යුක්තිය හා සාධාරණය ඉටුකිරීම පිළිබඳව මිනිසාගේ දුර්වලකම් ඉතා හොඳින් දන්නා මිනිසාගේ නිර්මාතෘ මෙම දුර්වලතාව පිළිබඳවද මිනිසාව දැනුවත් කරයි.

*"නුඹලා කොතෙක් ආශා කළද බිරියන් අතර යුක්ති සහගත සමානාත්මතාවකින් කටයුතු කිරීමට නුඹලාට නොහැක්කේමය. (එකියෙකු වෙත පමණක්) පූර්ණ නැඹුරු වීමකින් නැඹුරු වී (අනෙක් බිරිය විවාහ ජීවිතය හා දික්කසාදය අතර) එල්ලෙන (අවිනිශ්චිත) දෙයක් මෙන් නුඹලා අතහැර නොදමවූ. තවද නුඹලා (තමන්ව) සංශෝධනය කර ගනිමින් බියහක්තිමත් වන්නෙහු නම් එවිට සැබැවින්ම අල්ලාහ් අති ක්ෂමාශීලීය, පරම කරුණාභරිතය."* (අල් කුර්ආන් 4:129)

මෙයින් පැහැදිළි කරනුයේ මිනිසා කොතෙක් උත්සාහ කළද බිරියන් අතර සෙනෙහස පිළිබඳව සමානාත්මතාවක් පවත්වා ගෙන යෑමට මිනිසාට ඇති නොහැකියාවයි. ඉස්ලාමයේ ඉගැන්වීම් මෙම නොහැකියාව යථාර්ථයක් බව පිළිගන්නා අතර සෙනෙහස දැක්වීමේදී එක් බිරියක් සහමුලින්ම නොසලකා හැර තවත් බිරියක් වෙත අසීමිත ලෙස සෙනෙහස දැක්වීමේ තත්වයට පත් නොවන ලෙසය. මේ පිළිබඳව සමීප සමානාත්මතාවක් පවත්වාගෙන යෑමට නිරන්තරයෙන් උත්සාහ කළ යුතු වෙයි. නමුත් බිරියන් අතර ගත කරන කාලය හා භෞතික සම්පත් ලබා දීම පිළිබඳව සමානාත්මතාවක් අනිවාර්යයෙන්ම පවත්වා ගෙන යා යුතුය. මිනිසාට ස්ත්‍රී දූෂණයෙන් මිදී යහ පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සියලු මඟ පෙන්වීම් ඉස්ලාමයේ අන්තර්ගත ව ඇත. මෙම සියලු පහසුකම් නොතකා යමෙක් ස්ත්‍රී දූෂණයට පෙළඹෙන්නේ නම්

ඔහුට දඬුවම් දීම පිළිබඳව විරුද්ධ තාවක් දැක්වීම කෙසේ නම් සාධාරණීය කළ හැක්කේද?

පහත පුවත්පත් මගින් විවිධ මුස්ලිම් නොවන ප්‍රජා නායකයින් ඉල්ලා සිටින්නේ ද මෙම දඬුවම් පිළිවෙතයි. ඔවුන් අවධානය යොමු නොකළ එක් අංගයක් බවට පත් වී ඇත්තේ ඉස්ලාමය උගන්වන සදාචාරය ස්ථාපිත කිරීමේ හා සුරැකීමේ වැඩ පිළිවෙළ වෙත ඔවුන්ගේ අවධානය යොමු නොවී තිබීමය. ඔවුන්ට වඩා සාධාරණීය අයුරින් මනුෂ්‍ය වර්ගයාව පාපයෙන් අකුසලයෙන් හා සදාචාර විරෝධී ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ඉස්ලාමය ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ ස්ත්‍රී ඇඳුමට වඩා ගැඹුරු සංකල්පයකි. එම කරුණුත් තවත් ලිපියකින් සාකච්ඡා කිරීමට අදහස් කරන්නෙමු. එයින් බිඳක් පහතින් ඉදිරිපත් කර ඇත්තෙමු. මිනිසාව යහමඟ යැවීමට භෞතික පාලකයින් විශාල පිරිසක් අප සමාජයේ දක්නට ඇත.

භෞතික වශයෙන් බලගතු පාලකයෙකුගෙන් සිදුවන්නේ සත්ව ලෝකයේ මිනිසාට පමණක් උරුම තෝරා ගැනීමේ නිදහස හා අනෙකුත් සුවිශේෂී ලක්ෂණ අර්ථ විරහිත වී ගොස් ඔහු යාන්ත්‍රික තත්වයකට පත්වීම පමණි. භෞතික පාලකයෙකුට මිනිසාගේ ක්‍රියාවන්ගේ උල්පත වූ මනස පාලනය කළ නොහැක.

ඔහුගේ පාලකයා කෙසේ විය යුතු ද යත්:
ඔහු පාරභෞතික විය යුතුයි, සර්වඥ විය යුතුයි, සර්ව බලධාරී විය යුතුයි, විශ්වයේම පරමාධිපති විය යුතුයි, පරම කරුණාභරිත විය යුතුයි, සර්ව ශ්‍රාවක හා සර්ව දෘෂ්ටික විය යුතුයි, මිනිසාට නිවැරදි මග පෙන්වීම ලබා දෙන්නා විය යුතුයි, මරණින් මතු ලෝකයේ මිනිසාට විපාක දීමේ පූර්ණ බලය ඇත්තා විය යුතුයි.

<u>මෙවන් විශ්වාසයකින් ඇති යහපත</u>

1. මිනිස් නිර්මාණයේ මූලික පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමක්.
2. මෙම අවනතභාවය, කීකරුවීම, වහල්භාවය නිසා ලොව ඇති බලය, නිලය, ධනය වැනි කිසිම අධිකාරි සාධකයන් ඉදිරියේ වහල් නොවී මිනිස්කමේ අභිමානය රැක ගෙන නිහතමානීව ජීවත්වීමට ඇති හැකියාව.
3. ජීවිතයේ අභාග්‍ය දෑ සිදු වූ විට සිත තැන්පත්ව තබා ගැනීමේ හැකියාව. සිය දිවි නසා ගැනීමේ තත්වයට නොයෑම.
4. තම අධිපතිට පමණක් වහල්භාවය ඇති කර ගෙන තිබෙන හෙයින් ඔහුගේ නියමයන්ට අනුකූලව ජීවිතය සකස්කර ගැනීමට නිරන්තරව වෙර දැරීම.
5. වහලාගේ වගකීම තම ස්වාමියාගේ අණට අනුකූල වීම, ඔහුට ගෞරවකිරීම, අසීමිත ආදරයක් හා ඇල්මක් ඇති කර ගැනීම, නිරතුරුව තුති පිදීම.
6. තම ස්වාමියාට රහසින් කිසිවක් කරන්නට නොහැකි බව අවබෝධ කර ගන්නා හෙයින් බහු චරිතයෙන් මිදී ඒකීය යහ චරිතයක් ගොඩ නඟා ගැනීමට නිරතුරුව වෙහෙසීම.

එවන් පාලකයෙකු පිළිබඳ විශ්වාසය තහවුරු කර ගත් අයෙකු නොමග යා හැකිද?
මෙම පාලකයා සත්‍යයක්ද නැතිනම් මිත්‍යාවක්ද? මෙම මාතෘකාවද අපි, විශ්වාසය පමණක් නොව, යථාර්තය, බුද්ධිය, විචාරය හා නූතන විද්‍යාව ද පදනම් කර ගෙන සාකච්ඡා කරමු. මෙවන් විශ්වාසයක් වුවද මිනිස් සිතේ ඇති ස්වභාවය අනුව වරින් වර දුර්වල විය හැක.
මෙම විශ්වාසය නිරතුරුවම තහවුරු කොට මිනිසාව යහකමේ ශ්‍රේෂ්ඨත්වයට ගෙන යා හැකි වැඩ පිළිවෙළක් තිබේද?

## විශ්වාසය තහවුරු කොට දෙවිඳුන් කෙරෙහි ඇති බැඳීම ශක්තිමත් කරන වැඩ පිළිවෙළ

### දෛනික ව කළ යුතු පස් වේල සලාතය

“සැබැවින්ම සලාතය, ලැජ්ජා සහගත හා පාපතර ක්‍රියාවන්ගෙන් ඔබව ආරක්ෂා කරන්නේය” (අල් කුර්ආන් 29:45)

1. දෙවිඳුන්ට අවනත වීමකි. අන් සියලු නියමයන්ට අවනත වීමට මෙම අභ්‍යාසයෙන් පුහුණුවක් ලබා ගැනීම.
2. තම චෛතසිකයේ මතු වන නිහතමානිත්වයේ හඬකි.
3. සිත තැන්පත් කර ගෙන දෙවිඳුන් අබියස පෙනී සිටීමකි.
4. සමාජ සමානත්වතාව සඳහා වූ පුහුණුවකි.
5. සමාජ සාමූහිකත්වය සඳහා වූ පුහුණුවකි.
6. තම පරමාධිපති අබියස තමන්ගේ අවශ්‍යතාවයන් ඉදිරිපත් කිරීමට ඇති වඩාත් සමීපතම අවස්ථාවයි.
7. චිත්ත පාරිශුද්ධිය හා තැන්පත්භාවය සඳහා කරන්නා වූ දෛනික ව්‍යායාමයකි.
8. නියමිත වෙලාවට කටයුතු කිරීමට ලබන්නා වූ පුහුණුවකි.
9. අභ්‍යන්තර මෙන්ම බාහිර පිරිසිදුකම පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවට මග පෙන්වීමකි.

### උපවාස ශීලය

1. දෙවිඳුන්ට අවනත වීමකි. අන් සියලු නියමයන්ට අවනත වීමට මෙම අභ්‍යාසයෙන් පුහුණුවක් ලබා ගැනීම.
2. දෙවිඳුන් පිළිබඳ බියබැතිමත්භාවය හා දේව සවිඥාණකත්වය ගොඩ නගා ගැනීම.
3. චිත්ත ආවේගයන් පාලනයට පුහුණුවකි.

4. බහු චරිත ස්වභාවය ඉවත් කොට සම්මා ඒකීය චරිතයක් ගොඩ නඟා ගැනීම සඳහා වූ අභ්‍යාසයක්.
5. පසිඳුරන් පාලනය සඳහා වූ පුහුණුවකි.
6. දුප්පතුන් පිළිබඳ යථාර්ථය අවබෝධ කර ගැනීමට උපකාරයක්.

## <u>සකාතය</u>

1. දෙවිඳුන්ට අවනත වීමකි. අන් සියලු නියමයන්ට අවනත වීමට මෙම අභ්‍යාසයෙන් පුහුණුවක් ලබා ගැනීම.
2. වාර්ෂිකව තම වත්කමින් දිය යුතු දානමය ක්‍රියාවකි. ජනයාගෙන් අට කොටසකට දිය හැකියි.
3. තම වත්කමේ පවිත්‍රතාව හා වර්ධනය සඳහා වූ ක්‍රියාවකි.
4. අසීමිත තෘෂ්ණාව පාලනය කොට අන් අය කෙරෙහි කරුණාවෙන් යුක්තව කටයුතු කිරීමට මඟ පෙන්වීමකි.
5. දුගී බව තුරන් කිරීම සඳහා වූ වැඩ පිළිවෙළකි.
6. ඊර්ෂ්‍යාව තුනී කිරීමට හැකි මඟකි.
7. දුප්පත් පොහොසත් පිරිස අතර බැඳියාවක් ඇති කරවන්නක්.
8. සම්පත් සාධාරණ ලෙස බෙදී යාමට මඟ පෙන්වීමක්.

## <u>හජ් නැමදුම</u>

මිනිස් ඉතිහාසයේ දෙවිඳුන්ගේ අණට කීකරු වීමේ හා පරිත්‍යාගයේ උදාරතම උදාහරණය ලොවට පෙන්වා දුන් ඉබ්‍රාහිම් නබි තුමාගේ (එතුමා කෙරෙහි දෙවිඳුන්ගේ ආශිර්වාදය හා සාමය අත්වේවා) ජීවිතයේ සිදු වූ වැදගත් සිදුවීම් සිහිපත් කරමින් හා ඒවා සංකේතාත්මකව ඉටු කරමින් කරන්නා වූ ඉතා වැදගත් නැමදුමකි.

මිනිසාට මුළු ජීවිතයම නැමදුමක් බවට පත් කර ගන්නට ලබා ගත හැකි උච්චතම පුහුණුව ලෙස මෙය නම් කළ හැක.

"*කව්රුන් තමන්ව (තම චෛතසිකය) පාරිශුද්ධ කර ගත්තේද ඔහු නියත වශයෙන්ම ජයග්‍රහණය කළේය. කව්රුන් එය අපිරිසිදු කර ගත්තේද ඔහු නියත වශයෙන්ම අලාභ කර ගත්තේය*" (අල් කුර්ආන් 91:9-10)

"*තම තෘෂ්ණාව තමන්ගේ දෙවිඳුන් වශයෙන් පත් කර ගත්තන්ව ඔබ දැක ඇතිද? ඔබ ඔහුට ආරක්ෂකයෙකු වශයෙන් සිටින්නෙහිද? ඔවුන්ගෙන් බහුතරය සවන් දෙන්නන් හෝ සිතන්නන් වශයෙන් ඉන්නා බව ඔබ සිතන්නෙහිද? ඔවුන් තිරිසනුන් මිස අන් කිසිවක් නැත. සැබවින්ම ඔවුන් (තිරිසනුන්ට වඩා) ඉතාමත් නොමඟ ගියවුන් වශයෙන් සිටින්නෝය.*" (25:43-44)

"*කවුරුන් දෙවිඳුන් අබියස පෙනී සිටීම ගැන බිය වී ඉතාමත් පහත් ආසාවන්ගෙන් ඈත් වී තමන්ව වළක්වා ගන්නේද ඔහු ළඟා කර ගන්නා ස්ථානය නියත වශයෙන්ම ස්වර්ගයයි.*" (79: 40-41)

ඉස්ලාමය තුළ නියමිත ඉහත කෙටියෙන් විස්තර කරන ලද ප්‍රායෝගික වැඩ පිළිවෙළ අනුගමනය කිරීම සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් හා අකුසලයෙන් මිදී සාරධර්ම සපිරි ජීවිතයක් සකස් කර ගැනීමට මිනිසාට මග පෙන්වයි. වැරදි ක්‍රියාවන්ගෙන් මිනිසාව ආරක්ෂා කර ගැනීමට වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරමින් ක්‍රියා කරන ඉස්ලාමීය සංකල්පය මිනිසා ව රෝගයන්ගෙන් වළක්වා ගැනීමට වෛද්‍ය විද්‍යාව ඉදිරිපත් කරන රෝග වළක්වා ගැනීමේ වැඩ පිළිවෙළට බොහෝ දුරට සමානය. වැරදි කිරීමෙන් පසු ඔහු ප්‍රතිශෝධනය කිරීමට වඩා

වඩාත් උචිත වන්නේ ඔහුව එයින් වළක්වා ගැනීමේ සාර්ථක හා අර්ථවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමය. වැරදි කිරීමෙන් අයෙකු වුදිතයෙකු වෙනවා පමණක් නොවන අතර එම වැරැද්දෙන් අගතියට පත් වන පාර්ශවයක් ද ඇති වෙයි. මෙය සමාජ යහ පැවැත්මට සුදුසු තත්වයක් නොවේ. මෙවන් අපරාධ හා වැරදි හේතුවෙන් සමාජ ව්‍යුහයේ විශාල ඉරි තලා යැමක් සිදුවන්නට ඇති හැකියාවන් ඉතාමත්ම අධිකය. මිනිසාව යහමඟ තුළ රඳවා ගැනීමේ සියලු ප්‍රායෝගික ඉස්ලාමීය ක්‍රියාකාරකම් අබිබවා යමෙක් මෙවන් වැරදි වලට පෙලඹෙන්නේ නම් ඔහුට දඬුවම් කිරීම සාධාරණීය එකක් බව පිළිගැනීමට අපහසුතාවක් කෙසේ නම් මතුවිය හැකිද? දඬුවමට එරෙහි බහුතරය විසින් සිදු කරනුයේ මිනිසාට සියලු වැරදි කිරීමේ සමාජ පරිසරය පෝෂණය කොට වර්ධනය කිරීමේ සියලු කාර්යයන් පිළිබඳව නිහැඬියාව රැක ඉන් පසුව කෙනෙකුගෙන් අපරාධයක් සිදු වූ පසු ඔහුව රැකීමට තර්ක හා යෝජනා ඉදිරිපත් කිරීමය. මෙවන් අපරාධ මගින් අගතියට පත්වන පාර්ශවයන් පිළිබඳව ඔවුන් නිහඬය. ඔවුන්ගේ ප්‍රයත්නය අශ්වයා පැණ ගියාට පසු ඉස්තාලය වැසීම වැනි ක්‍රියාවක් පමණි.

## ෂරිආ පිළිවෙත ක්‍රියාත්මක කිරීම කාගේ වගකීමද?

සැබැවින්ම සෑම මුස්ලිම් වරයෙකුගේම වගකීම වන්නේ ෂරිආ පිළිවෙතේ අර්ථය හා ජීවය සුරැකෙන පරිදි තම ජීවිතය සකස් කර ගෙන යහකම් වෙත ජනයා දිරිගන්වමින් හා අයහකම් වලින් ජනයා අධෛර්යය කොට එයින් ඔවුන්ව වළක්වා ගැනීමට කටයුතු කිරීමය. කෙසේ නමුත් මේ සියල්ල වහාම හෝ ක්ෂණිකව ක්‍රියාවට පරිවර්තනය කළ හැකි කරුණු

නොවන බව අපි හොඳින් දන්නෙමු. යහකම ප්‍රගුණ කිරීම හා අයහකම පිටුදැකීම අනුක්‍රමික පිළිවෙතක් අනුව ක්‍රියාත්මක කළ යුතු බව මුහම්මද් ධර්ම දූතයාණන් (එතුමා කෙරෙහි දෙවිඳුන්ගේ ආශිර්වාදය හා සාමය අත්වේවා) විසින් පිහිටුවා ගන්නා ලද පළමු ඉස්ලාමීය රාජ්‍යය අනුගමනය කළ ක්‍රියා කලාපය දෙස බලන විට අපට අවබෝධ කර ගත හැකි වනු ඇත. පළමු වසර දහ තුනක කාලය තුළ සලාතය ඉටුකිරීම වැනි ඉතාමත්ම සුළු වගකීම් හැරෙන්නට වැඩි වගකීම් එම ආරම්භක මුස්ලිම් සමාජය වෙත පැවරී නොතිබුණි. අල් කුර්ආනය මගින් මෙම කාල වකවානුවේ පහළ කළ පණිවිඩය ද යොමු වී තිබුණේ අල්ලාහ් කෙරෙහි වූ විශ්වාසය ශක්තිමත් කිරීම මෙන්ම දෙවිඳුන්ගේ අපරිමිත කරුණාව සර්ව ඥානිත්වය වැනි ගුණාංගයන් පිළිබඳව කරුණු දැක්වීමටය. මෙම වසර දහ තුන තුළ විශ්වාසය පරිපූර්ණත්වයට ගෙන ඒමෙන් පසුව අනුගමනය කිරීමට නියම කරනු ලැබූ සෑම දෙයක්ම සතුටින් පිළිගෙන ක්‍රියාත්මක කිරීම මුහම්මද් තුමාණන්ගේ මිත්‍රයින්ට හා අනුගාමිකයින්ට පහසු කාර්යයක් විය. එහෙයින් මිනිසත්කමේ උසස්ම හා ශ්‍රේෂ්ඨතම අගයන් මිනිස් චින්තාවේ ස්ථාපිත කොට ෂරිආ පිළිවෙතේ සැබෑ ඵලය භුක්ති විඳීමට කටයුතු කිරීම සෑම මුස්ලිම් වරයෙකුගේම මෙන්ම සම්බන්ධිත ආයතනයන්ගේ වගකීම වෙයි.

## <u>'හුදූද්' බල ගැන්වීමේ අයිතිය පැවරී ඇත්තේ කා හටද?</u>

හුදූද් (නිශ්චිත දඬුවම්) දෙවිඳුන්ගේ විධානයන් වන අතර මෙය බල ගැන්වීමේ අයිතිය <u>ඉස්ලාමීය රාජ්‍යයක් තුළ ජීවත්වන</u> සෑම මුස්ලිම් වරයෙකුගේම වගකීම වෙයි. කෙසේ නමුත් මෙය ක්‍රියාත්මක කර වීමේ අයිතිය ඉස්ලාමීය රාජ්‍යයේ ඉස්ලාමීය අධිකරණ ක්‍රියාවලිය වෙත පැවරී ඇති වගකීමකි. සිවිල් සමාජ

පුද්ගලයින් හැටියට මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට කිසිවෙකුට තනි අයිතියක් නොමැත. එනිසා පුද්ගලයින් විසින් එකිනෙකා වෙත හුදුද් දඬුවම් පැමිණවීමේ පිළිවෙතක් ඉස්ලාමය තුළ නොමැත.

## දඬුවම් සම්ප්‍රදායක් අවශ්‍යමද?

'දඬුවම' සෑම අධිකරණ ක්‍රියාවලියකම අත්‍යවශ්‍ය කොටසක් බවට පත් ව ඇත. යහ ක්‍රියාකාරකම් වෙනුවෙන් යහ ආනිසංසද අයහකම් වෙනුවෙන් අයහ ආනිසංසද ලබා දීම මෙම ක්‍රියාවලියේ කොටසක් ය. දඬුවම් සංකල්පය විවිධ ක්ෂේත්‍රයන්හි විවේචනයට හා මතභේදයට ලක් වූ මාතෘකාවකි. කෙසේ නමුත් ඒ දෙස බැලිය යුතු වන්නේ 'දඬුවම' යන පටු සීමාව තුළ පමණක් නොරැඳී 'සමාජ යහපත' යන විශාල වූ ක්ෂේත්‍රය දෙසම අවධානය යොමු කරමිනි. ඉස්ලාමීය කෝණයෙන් 'නීතිය' පමණක් සමාජ සදාචාරය ස්ථාපිත කරන ප්‍රධාන හෝ එකම ආයතනය ලෙස නොසැලකේ. නීතිය මගින් සිදු වන්නේ සදාචාරය ස්ථාපිත කිරීමට ආධාරකයක් ලෙස කටයුතු කිරීම පමණි. මිනිසා විසින් පිළිපැදිය යුතු අන්‍යෝන්‍ය අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව දෙවිඳුන් විසින් පැහැදිලි ඉගැන්වීම් අපහට ලබා දී තිබේ. මනුෂ්‍ය සමාජය සාමය හා සහජීවනය පදනම් කර ගෙන ජීවත්වීම පිණිස සීමාවන් හා මායිම් ද දෙවිඳුන් විසින් සකස් කොට දී තිබේ. මිනිසා මෙම සීමාවන් තුළ තම ජීවිතය සකස් කර ගැනීමට කටයුතු නොකරන අවස්ථාවන්හිදී ඔහු තමන්ට මෙන්ම මුළුමහත් සමාජ පද්ධතියටම විශාල හානියක් සිදු කරයි. මෙවන් අවස්ථාවන් හි චූදිත පුද්ගලයා සම්බන්ධව පළි ගැනීමේ චේතනාවකින් තොරව සමාජ යහ පැවැත්ම අරමුණු කර ගෙන ඔහුව මෙන්ම මෙවන් වැරදි ක්‍රියාකාරකම් වලට නැඹුරු වීමක් ඇති අන් අයව එවන් කටයුතු වලින්

වළක්වා ගැනීමේ හා අධෛර්යය කිරීමේ අරමුණින් දෙවිඳුන් නියම කළ දඬුවම් ක්‍රියාත්මක කිරීම ඉස්ලාමීය පිළිවෙතයි.

## දඬුවම් හා අපරාධ පිළිබඳව ඇති දේශීය මතයන් කුමක්ද?

**මව්බිම** 2012 මාර්තු 12 සඳුදා

## ළමා අපයෝජන, මත්ද්‍රව්‍ය ජාවාරමට හා ස්ත්‍රී දූෂණයට දඬුවම මරණය

පක්ෂ විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අස්සනින් ජනපතිට සන්දේශයක් (ලක්ෂ්මී ජයකොඩි)

“ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන හා මත්ද්‍රව්‍ය ජාවාරම් වල වැරදි කරුවන්ට මරණ දඬුවම ලබා දිය යුතු යැයි යෝජනා කරමින් පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම මන්ත්‍රී වරුන්ගේ අස්සනින් යුත් සංදේශයක් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත බාර දීමට නියමිතය.

අදාළ සංදේශය ඉදිරි සති දෙක ඇතුළත ජනාධිපතිවරයා වෙත බාර දීමට කටයුතු කරන බවද ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනි සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ‘මව්බිම’ ට පැවසුවාය.

ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන හා මත්ද්‍රව්‍ය ජාවාරම් වලට වැරදිකරුවන් බවට පත් වන පුද්ගලයන්ට කිසිඳු තරාතිරමක් අනුකම්පාවක් නොබලා මරණ දඬුවම නියම කළ යුතු බවත්

පවත්නා නීති වලට අනුව ඕනෑම ලොකු වැරැද්දක් සිදු කර බේරීමට හැකියාව පවතින බවත් ඇය කියා සිටියාය.

ඒ අනුව කහවත්ත ද්විත්ව ඝාතන නඩුවේ වැරදි කරුවන්ටද තරාතිරම නොබලා මරණ දඬුවම ලබා දිය යුතු බවද තමන් එම සංදේශයෙන් ඉල්ලා සිටින බව ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය කීවාය.
අදාළ සංදේශයට පක්ෂ විපක්ෂ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ අස්සන් ලබා ගැනෙන බවද ඇය සඳහන් කළාය.”

**<u>ලක්බිම</u>** 2012 මාර්තු 12 සඳුදා

## <u>කාන්තාවන් ළමුන් අපයෝජනය කරන අයට හා මත්කුඩු ජාවාරම් කරුවන්ට මරණ දඬුවම දෙන්න</u>

සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ අස්සනින් යුතු පෙත්සමක් ජනපතිට
(ලසන්ත වීරකුලසූරිය/ගයාත්‍රී ගීගනආරච්චි/එම්. ජී. රවීන්ද්‍ර හිඟුරාන)
මව්බිම පුවත්පතේ පළ වූ ප්‍රවෘත්තියම මෙලෙස ලක්බිම පුවත් පතේද පළ කර තිබිණි.

**<u>මව්බිම</u>** 2012 ජනවාරි 21 සෙනසුරාදා

# 2011 මුල් මාස හතට <u>ළමයින් විසි දහසක් අපයෝජනය කරලා</u>

"ඉකුත් 2011 වසරේ පළමු මාස හත ඇතුළත ළමා අපයෝජන පැමිණිලි 20606 ක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇත. අංක 1929 දරණ ළමා උපකාරක සේවාව යටතේ ලැබුණු දුරකථන ඇමතුම් වලින් මේ බැව් හෙළිදරව් වී තිබේ."

**<u>රිවිර</u>** 2012 මාර්තු මස 17 වැනි සෙනසුරාදා

# මේ අපරාධ රැල්ල මඩින්න එල්ලුම් ගස අවශ්‍යයි

**ඇමති මෛත්‍රීපාල සිරිසේන**

"රට පුරා ශීඝ්‍ර ලෙස වර්ධනය වන අපරාධ රැල්ල මැඩපැවැත්වීම සඳහා නැවත වරක් එල්ලුම් ගස ක්‍රියාත්මක කළ යුතු බවත් රජ කාලේ අපරාධ අඩු වුයේ රජවරුන් අනුගමනය කළ දඬුවම් ක්‍රම නිසා බැවින් එවැනි ක්‍රම නොවුනත් එල්ලුම් ගස ක්‍රියාත්මක කිරීම තමන් සම්පුර්ණයෙන් අනුමත කරන බවත් ශ්‍රීලනිප මහ ලේකම් අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතා "රිවිර"ට පැවසීය.

අමාත්‍යවරයා මෙම අදහස් පළ කළේ "රිවිර" සමග සම්මුඛ සාකච්ඡාවට එක්වෙමිනි.

**<u>දිවයින</u>** 2012 මාර්තු මස 19 වැනි සඳුදා

**<u>කතු වැකියෙන් කොටසක්</u>**

## <u>"කටුගෙය කැඩීම"</u>

(සැකයේ වාසිය මෙවර පැමිණිල්ලට)

"රට ජාතියේ ඉතිහාසයේ අගය නොදත් කාලකන්නි හැම රටකම සිටිති. අද මහනුවර කෞතුකාගාරයේ ඇත්තේ II වන රාජසිංහ රජුගේ ඔටුන්නේ අනුරුවකි. කොළඹ කෞතුකාගාරයට පැන්න හොර රැළ අල්ලා **<u>සිංහල රජ කාලයේ දඬුවම් දුන්නද මැනවි</u>**. නැතහොත් තව දවසක මෙහි එන තවත් හොර රැළක් රට රටවල රාජ්‍ය නායකයන්ගෙන් ලැබී මෙහි තැන්පත් කර ඇති රන් රිදී තෑගී භාණ්ඩ, ඉතිරි පුරාවස්තු ටික පමණක් නොව තල්මසාගේ අටසකිල්ලද ට්‍රැක්ටරයක පටවා ගෙන පැන යනවා ඇත."

**<u>රිවිර</u>** 2012 මාර්තු මස 21 වැනි බදාදා

"*<u>මත්පැන් නිපදවීම සම්බන්ධයෙන් විසි වතාවක් වරදකරු වූ අයෙකුට දඩ</u>*"

"මත්පැන් නිපදවීම සහ විකිණීම සම්බන්ධයෙන් විසි වතාවක් අධිකරණයෙන් වරදකරු වූ ගාල්ල මහවත්ත ප්‍රදේශයේ පුද්ගලයෙකුට ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් තමාලි මහේෂිකා දන්තසූරිය මෙනෙවිය විසින් රුපියල් 1,15,000 ක දඩයක් පසුගිය 19 වනදා නියම කළාය."